කොන්දේසි සහ නියමයන්

වැදගත් : සීමාසහිත කාගිල්ස් බැංකුව මගින් නිකුත් කරන කාඩ්පත මත අත්සන් කිරීමට හෝ භාවිතා කිරීමට පෙර කාඩ්පත් හිමියන්ට අදාළ ගිවිසුම කියවා තේරුම් ගතයුතු බව සලකන්න. කාඩ්පත ලබාගැනීම සහ/හෝ අත්සන් කිරීම සහ/හෝ එය භාවිතා කිරීම මගින් පහත සඳහන් කොන්දේසි සහ නියමයන්ට ඔබ බැඳීසිටින බව සලකන්න.

1. අර්ථදැක්වීම්:

1.1 ගිණුම(ම්) - කාඩ්පතට අදාළ වලංගු ගනුදෙනු සිදුකිරීම සඳහා කඩ්පත්හිමියගේ ඉල්ලීම පරිදි කාගිල්ස් බැංකුවමගින් නිර්මිත ප්‍රාමප්මිකගිණුමද ඇතුලත්ව එම පුද්ගලයා විසින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ සහ/හෝ ජංගම ගිණුම(ම්) මෙයින් අදහස් වේ.

1.2 ගිණුම්හිමියා - කාගිල්ස් බැංකුව සමග ගිණුමක්/ගිණුම් පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කීපදෙනෙකු මෙයින් අදහස් වේ.

1.3 ගිණුම් ප්‍රදකාශනය - කාගිල්ස් බැංකුව විසින් ගිණුම්හිමියෙකු වෙත යවනු ලබන යම්කිසි කාලසීමාවක් තුල සිදු කල සියලු ගනුදෙනු විස්තර (කාඩ්පත් ගනුදෙනුද ඇතුලත්ව), අදාළ දිනයට ගිණුම් ශේෂය සහ ඇතුලත් කිරීමට අවශ්‍යයුයැයි බැංකුව විසින් සලකනු ලබන වෙනත් කරුණු ඇතුලත් ප්‍රැකාශයක් මෙයින් අදහස් වේ.

1.4 ස්වයංක්‍රීනය ටෙලර් යන්ත්‍රතය (ATM) - කොන්දේසි සහ නියමයන් තුල ඇතුලත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය යන්නෙන් කාඩ්පත් භාවිතයෙන් ඕනෑම ජාලයක් තුල ක්‍රිට්‍රියාත්මක වන (කාඩ්පත නිකුත්කර තිබෙන රට තුල හෝ විදේශයන්හි) සමාන ටෙලර් යන්ත්‍ර යන් අදහස් වේ.

1.5 බැංකුව - සීමාසහිත කාගිල්ස් බැංකුව, එම බැංකුවෙහි අනුප්‍රාප්තිකයන් හා බැංකුව වෙනුවෙන් පත්කරනු ලැබූවන් අදහස් වේ.

1.6 කාඩ්පත - බැංකුව විසින් නිකුත්කරනු ලැබූ හර කාඩ්පත යන්න අදහස් වේ.

1.7 කඩ්පත්හිමියා - බැංකුව විසින් කාඩ්පතක් නිකුත්කරන ලද ගිණුම්හිමියා යන්නඅදහස් වේ.

1.8 කාඩ්පත භාවිතයෙහි සීමාව - බැංකුව මගින් එක් කාඩ්පතක් සඳහා එක් දිනයක් තුලදී POS ටර්මිනලයක් සහිත විකුණුම් ස්ථානයකදී භාවිතා කිරීමට හෝ ස්වයංක්‍රී ය ටෙලර් යන්ත්‍රයක් මගින් මුදල් ආපසු ලබාගැනීමට හෝ ලබා දී ඇති උපරිම මුදල් ප්‍රහමාණය මෙයින් අදහස් වේ.

1.9 අලෙවිසැල්- තම භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් මාධ්‍යයක් ලෙස හර කාඩ්පත පිළිගන්නා හෝ පිළිගැනීමට බලාපොරොත්තු වන ඕනෑම ස්ථානයක පිහිටි ආයතනයක් මෙයින් අදහස් වේ.

1.10 විදේශ ගනුදෙනු - ශ්‍රීක ලංකාවෙන් පිටතදී සිදුකරන ගනුදෙනු මින් අදහස් වේ.

1.11 පුද්ගලික රහස්‍යඅංකය (PIN) - කාඩ්පත භාවිතා කිරීමට බැංකුව මගින් ලබාදෙන හෝ කාඩ්පත්හිමියා විසින් තෝරාගනු ලබන පුද්ගලික රහස් අංකය මෙයින් අදහස් වේ.

1.12 ගනුදෙනු - අදාල ගාස්තුද ඇතුලත්ව කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන ඕනෑම ආකාරයේ ගනුදෙනුවක් මෙයින් අදහස් වේ. (උදා:- මුදල් ආපසු ගැනීම, වෙනත් ගිණුමකට මුදල් සම්ප්‍රේෂණය, POS ටර්මිනලයක් සහිත විකුණුම් ස්ථානයන්හි සිදුවන ගෙවීම්, අන්තර්ජාලය හරහා භාණ්ඩ සහ සේවා සඳහා කරනුලබන ගෙවීම්)

1.13 දුරකථන රහස්යළ අංකය (T-PIN) - දුරකථන මාර්ගය ඔස්සේ සිදුකරනු ලබන බැංකු කටයුතු වලදී කඩ්පත්හිමියා හඳුනාගැනීමේ ක්රකමවේදයක් ලෙස බැංකුව මගින් ලබා දෙනු ලබන හෝ කඩ්පත්හිමිය විසින් තෝරාගනු ලබන රහස්යද අංකය මෙයින් අදහස් වේ. මෙමෙ පහසුකම බැංකුවේ අභිමතය පරිදි ලබා දෙනු ලැබේ.

1.14 OTAC - කාඩ්පත සමග භාවිත කිරීම සඳහා බැංකුව මගින් කෙටිපණිවිඩ මාර්ගයෙන් එවනුලබන කේතය මින් අදහස් වේ.

1.15 තුන්වන පාර්ශවයේ සේවා සපයන්නන් - කාඩ්පත් මගින් වඩා වැඩි ප්රරතිලාබ හා/හෝ සේවාවන් ලබා දීමේ අරමුණින් බැංකුව හා සම්බන්ධ වී ඇති තුන්වන පාර්ශවයේ සේවා සපයන්නන් මෙයින් අදහස් වේ.

02. කොන්දේසි හා නියමයන්හි යෝග්යසතාවය සහ ව්යමවස්ථාපිත අනුකූලතාවය

2.1 කඩ්පත්හිමිය විසින් ඔහුගේ/ඇයගේ අත්සන කාඩ්පත මත යෙදීම හා/හෝ කාඩ්පත භාවිත කිරීම මගින් බැංකුව විසින් ඕනෑම පුද්ගලයෙකුට පිරිනැමෙන පහසුකම් හෝ කාඩ්පතහා සම්බන්ධව පිරිනැමෙන සියලුම පහසුකම් මෙකී ගිවිසුමෙහි සඳහන් කාලානුරූපිතව සංශෝධනය විය හැකි කොන්දේසි හා නියමයන්ට යටත් වන බවට සාක්ෂි දරයි.

2.2 කාඩ්පත භාවිතා කිරීම, කලනුරූපිතව සංශෝධනය වන ශ්රීය ලංකා විනිමය පාලන රෙගුලාසි, අදාල සියලුම නීතිරීති, සහ අනෙකුත් අදාල ප්ර තිපත්ති සහ රෙගුලාසි වලට තරයේ යටත් වේ.

2.3 වාණිජ ප්ර්මාණයන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම හෝ ආනයනය කිරීම සඳහා හෝ ප්රාිග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත/කාඩ්පත් භාවිත නොකළ යුතුය.

2.4 කාඩ්පත භාවිත කිරීම තුලින් විදේශ මුදල් ඒකකයන්ගෙන් සිදුකරනු ලබන විද්යු ත් මුදල් හුවමාරු කිරීම් (EFT) හෝ මුදල් ආපසු ලබා ගැනීම් සිදුකල හැක්කේ අවසරලත් කටයුතු සඳහා පමණක් වන අතර ඒ සියල්ල කලනුරූපිතව වෙනස් විය හැකි විනිමය පාලන දෙපාර්තමේන්තු රෙගුලාසි වලට අදාල වේ.

2.5 විනිමය පාලන හා/හෝ වෙනත් නියාමන ආයතනයන් මගින් කලනුරූපිතව සංශෝධන වන රෙගුලාසි වලට අනුකූල වීමට බැංකුවහට සිදුවන අතර ශ්රීම ලංකා සමාජවාදී ජනරජයේ නීති හා රෙගුලාසි වලට අනුව ගනුදෙනු හා සම්බන්ධ තොරතුරු අදාල බලයලත් අධිකාරීන් වෙත අනාවරණය කිරීමට බැංකුව බැදීසිටී.

2.6 කාඩ්පත භාවිතයෙන් සිදුවන, කඩ්පත්හිමියා විසින් අවසර දෙන හෝ නොදෙන සියලුම ගනුදෙනු සඳහා කඩ්පත්හිමියා විසින් වගකිවයුතුය. එමෙන්ම, අවසරනොලත් කටයුතු සඳහා කාඩ්පත යොදාගැනීමෙන් හෝ පුද්ගලික රහස් අංකය, OTAC හා/හෝ දුරකථන රහස් අංකය අවභාවිතයෙන් බැංකුව වෙත සිදුවන සියලුම පාඩු/අලාභ සඳහාද කඩ්පත්හිමියා හට වන්දිගෙවීමට සිදුවන අතර, ශ්රීෙ ලංකා විනිමය පාලන රෙගුලාසි හා වෙනත් අදාල සියලුම නීති රීති උල්ලංඝනය කිරීම මත පමුණුවනු ලබන දඩුවම් විදීමටද සිදුවනු ඇත.

2.7 විනිමය පාලන රෙගුලාසි හෝ වෙනත් ව්යකවස්ථාපිත රෙගුලාසි උල්ලංඝනය වී ඇති බවට විශ්වාශ කල හැකි ඕනෑම අවස්ථාවකදී කඩ්පත්හිමියා/හිමියන් වෙත පෙර දැනුම්දීමකින් තොරව කාඩ්පත අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

2.8 කාඩ්පත භාවිතය මගින් සිදුකරනු ලබන මුදල් ආපසු ගැනීම්, වෙනත් ගිණුමකට මුදල් සම්ප්රේ ෂණය කිරීම් හා/හෝ වෙනත් ඕනෑම ගනුදෙනුවක් අදාල ගිණුමට හර වන අතර කඩ්පත්හිමියා විසින් ගනුදෙනු සඳහා අවශ්යෙ මුදල් ප්ර මාණය ගිණුමෙහි

පවත්වාගත යුතුය. කඩ්පත්හිමියා විසින් ගිණුම වෙනස් කිරීමට තීරණය කරන්නේනම් ඔහු/ඇය ඒබව බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

2.9 ඒකාබද්ධ ගිණුමක් පවත්වාගෙන යාමේදී ඒ හා සම්බන්ධ එක් එක් ගිණුම්හිමියා සඳහා වෙන වෙනම කාඩ්පත් අයදුම් කිරීමේ හැකියාව පවතින අතර කාඩ්පත/කාඩ්පත් මගින් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා එම සියලුම ගිණුම්හිමියන් ඒකාබද්ධව හා තනි තනිව වගකිවයුතුය.

03. කාඩ්පත් සේවා

කඩ්පත්හිමිය විසින් කාඩ්පත ලබාගත් අවස්ථාවේම එහි පිටුපස තම අත්සන යෙදිය යුතු අතර එම අත්සන එකී කාඩ්පත්හිමියාගේ ගිණුමට අදාළ ලිපිලේඛන මත යෙදූ අත්සනට සමාන විය යුතුය.

කාඩ්පත කිසිදු අවස්තාවකදී පැවරිය නොහැක.

04. කාඩ්පත භාරදීම

භාණ්ඩ හුවමාරු සේවාවන් මගින්, ලියාපදිංචි තැපැල මගින් හෝ කාඩ්පත් හිමියා හෝ බලයලත් තෙවන පාර්ශවයක් විසින් බැංකුවට පැමිණ කාඩ්පත ලබා ගත හැක. කාඩ්පත්හිමියා හට කාඩ්පත/කාඩ්පත් ලැබුණු වහාම ඔහු/ඇය විසින් තම අනන්‍යවතාවය තහවුරු කර, කාඩ්පත් භාර ගත බව තහවුරුකරනු ලබන පත්රිඩකාව මත අත්සන් කල යුතුය. කාඩ්පත්හිමියාගේ අභිමතය පරිදි ලිඛිත දැනුම්දීමක් මගින් ඔහු/ඇය වෙනුවට කාඩ්පත/කාඩ්පත් ලබාගැනීමට තෙවන පාර්ශවයකට බලය පැවරිය හැකි අතර කාඩ්පත්හිමියා හෝ බලයලත් තෙවන පාර්ශවය මගින් කාඩ්පත ලබාගත් අවස්ථාවේ සිට දරන සෑම ගාස්තුවකම වගකීම කාඩ්පත්හිමියා සතුය. බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් හෝ එහි නියෝජිතයෙකු විසින් තීරණය කරනු ලබන කාඩ්පත්හිමියාගේ නියෝජිතයෙකු ලෙස යම් තුන්වන පාර්ශවයකට කාඩ්පත භාරදීම සිදුකල හැක. කාඩ්පත ලබාදුන් අවස්ථාවේ සිට කාඩ්පතට අදාල සියලුම ගාස්තු සඳහා කාඩ්පත්හිමිය වගකිවයුතුය.

05. කාඩ්පත භාවිතය

5.0.1 කාඩ්පත්හිමියා මගින් ඔහුගේ/ඇයගේ පුද්ගලික රහස් අංකය (PIN), OTAC හා දුරකථන රහස්‍යභ අංකය (T-PIN) රහසිගතව සහ කාඩ්පතින් වෙන්ව තබාගත යුතු අතර කාඩ්පත සුරක්ෂිතව තබා ඇති බවටත්, වෙනත් පුද්ගලයෙකු විසින් භාවිතා කිරීමට ඉඩ ලබා නොදීමටත් කටයුතු කල යුතුය. කාඩ්පත්හිමියාගේ අනුදැනුම ඇතිව හෝ නොමැතිව කාඩ්පත, පුද්ගලික රහස් අංකය, OTAC හෝ දුරකථන රහස්යි අංකය මගින් සිදුකරන සියලුම ගනුදෙනුවල වගකීම කාඩ්පත්හිමියා සතුවේ.

5.0.2 කාඩ්පත භාවිතාකිරීමේ සීමාව බැංකුවේ අභිමතය පරිදි අඩු හෝ වැඩි කලහැකි අතර එමගින් කාඩ්පත්හිමියාහට සිදුවන කුමන ආකාරයේ හෝ පාඩුවක් හා/හෝ අලාභයක් හා/හෝ කාඩ්පත්හිමියාගේ කීර්තිනාමයට සිදුවන හානි සඳහා බැංකුව වගකියනු නොලැබේ.

5.0.3 කාඩ්පත භාවිතා කල හැක්කේ කාඩ්පතේ මුහුණත මුද්රිණය කර තිබෙන මාසයේ අවසන් දිනය දක්වා පමණි.

5.0.4 කාඩ්පත්හිමියා මගින් ලිඛිතව බැංකුව වෙත කාඩ්පත ප්රතික්ෂේපකිරීම දෙනුම්දෙන තුරු බැංකුවේ තනි අභිමතය පරිදි කාඩ්පත අළුත්කිරීම හා/හෝ කාඩ්පත් ආදේශණය කිරීම සඳහා කාඩ්පත් නිකුත් කිරීම සිදුකරන ලෙසට ඔහු/ඇය විසින් ස්ථාවර

ඉල්ලීමක් කර ඇති බවට එකඟවේ. කාඩ්පත කල් ඉකුත්වීමකදී, අස්ථානගතවීමකදී, පලුදු වූ අවස්ථාවකදී හෝ සොරකම් කරනු ලැබූ අවස්ථාවකදී, කාඩ්පතක් නිකුත්කිරීමේ තනි අයිතිය බැංකුව සතුය.

5.0.5 කාඩ්පත්/කාඩ්පත් සහ බැංකුව සමග කෙරෙන සෑම කටයුත්තකදීම විශ්වාසවන්ත ලෙස ක්රිහයා කිරීමට කඩ්පත්හිමියා සැදී පැහැදී සිටිය යුතුය.

5.1 ස්වයංක්රීාය ටෙලර් යන්ත්රසය (ATM) භාවිතය

5.1.1 කාගිල්ස් බැංකුවේ ස්වයංක්රීරය ටෙලර් යන්ත්රA හරහා සහ ලොව පුරා ඇති සියලුම LankaPay, MasterCard, Maestro සහ Cirrus යන ස්වයංක්රීලය ටෙලර් යන්ත්ර හරහා කාඩ්පත මගින් ගනුදෙනුකල හැක.

5.1.2 ආරක්ෂක පියවරක් ලෙස කාඩ්පත නිකුත් කරන අවස්ථාවේදී ස්වයංක්රීෙය ටෙලර් යන්ත්රම මගින් භාවිතා කිරීම අත්හිටුවා තිබේ. ස්වයංක්රීවය ටෙලර් යන්ත්රා ඔස්සේ කාඩ්පත භාවිත කිරීම සඳහා කාඩ්පත සක්රීටය කරගැනීමට කාඩ්පත්හිමියා විසින් බැංකුවෙහි දුරකථන මධ්යකස්ථානය අමතා ඉල්ලීමක් කල යුතුය.

5.1.3 බැංකුව මගින් එවනු ලබන OTAC අංකය පුද්ගලික රහස්ය අංකය නොවේ. කාගිල්ස් බැංකුවේ අන්තර්ජාල බැංකු ක්රකමවේදය හෝ දුරකථන බැංකු ක්රනමවේදය හෝ ඕනෑම කාගිල්ස් බැංකු ස්වයංක්රීහය යන්ත්රඅයක් භාවිතයෙන් කාඩ්පත්හිමියා විසින් OTAC අංකය භාවිතයෙන් පුද්ගලික රහස්යර අංකය නිර්මාණය කරගත යුතුය.

5.1.4 බැංකුව මගින් නිකුත්කළ පුද්ගලික රහස්ය අංකය නොමැතිව කිසිදු කාඩ්පත්හිමියෙකුට ස්වයංක්රීාය ටෙලර් යන්ත්රO භාවිතයෙන් මුදල් ආපසු ගැනීමට නොහැක.

5.1.5 බැංකුවේ තනි අභිමතය පරිදි ස්වයංක්රීරය ටෙලර් යන්ත්රි මගින් මුදල් සම්ප්රේවෂණ පහසුව සහ සියලුම ගනුදෙනු වලට අදාල මුදල් සම්ප්රේුෂණ පහසුකම් තාවකාලිකව හෝ ස්ථිරව නවතා දැමිය හැක. එමෙන්ම දිනයක් තුලදී ස්වයංක්රීවය ටෙලර් යන්ත්රය භාවිතයෙන් සම්ප්රීෂණය කල හැකි මුදල් ප්රාමාණය, භාණ්ඩ මිලදී ගැනීම හා මුදල් ආපසු ලබා ගැනීම සඳහා ලබාදී ඇති උපරිම සීමාවන් වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුය.

5.1.6 කාගිල්ස් බැංකුව හැර වෙනත් බැංකුවකට අයත් ස්වයංක්රී ය ටෙලර් යන්ත්රමයකින් මුදල් ආපසු ගැනීමේදී පවතින තීරුබදු ගාස්තුවලට අනුව මුදල් ආපසු ගැනීමේ ගාස්තු වලට යටත් වන අතර එම මුදල අදාල ගිණුමට හර වේ.

5.1.7 ස්වයංක්රීතය ටෙලර් යන්ත්රු භාවිතය මගින් මුදල් ආපසු ගැනීමේදී එම යන්ත්ර ය මගින් නිකුත්කරන ගිණුම් ප්රෙකාශනය බැංකුව විසින් ස්ථිර කරනතාක් නිශ්චිත වේ. එසේ බැංකුව විසින් ස්ථිර කරනු ලබන මුදල් ප්රආමාණ අවසාන හා නිශ්චිත මුදල් ප්රකමාණය ලෙස කාඩ්පත්හිමියා හා බැඳී පවතී.

5.1.8 කාඩ්පත හෝ ස්වයංක්රීඑය ටෙලර් යන්ත්රය ක්රබමවත්ව ක්‍රියානොකිරීම හෝ ඇණහිටීම හෝ ස්වයංක්රීරය ටෙලර් යන්ත්රරයෙහි ඇති මුදල් ප්රමමාණවත් නොවීම නිසා කාඩ්පත නැතිවීම හෝ කාඩ්පතට හානි සිදුවීම ආදී සිදුවීම්වලට කාඩ්පත්හිමියා විසින් බැංකුව වගකිවයුත්තා බවට පත්නොකළ යුතුය.

5.1.9 ස්වයංක්රීාය ටෙලර් යන්ත්රකින් කාඩ්පත් භාවිතා කර ලබාගත හැකි මුදල් ප්රකමාණය සීමා කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු වන අතර කාඩ්පත්හිමියාට මුදල් ලබා ගත හැක්කේ අදාළ සීමාව දක්වා පමණි.

5.2 වෙළඳ කටයුතු සඳහා භාවිතය

5.2.1 කාඩ්පත වලංගු වන්නේ ලොවපුරා විද්‍යුණත් භාවිතයන්ට පමණක් වන අතර POS POS ටර්මිනලයක් සහිත වෙළඳ ස්ථානයන් මගින් පමණක් කාඩ්පත පිළිගනු ඇත. කෙසේ වුවත් කුමන හෝ හේතුවක් මත කාඩ්පත ප්‍රඅතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සහ වෙළඳ ස්ථානය සතුවේ. කාඩ්පත භාවිතා කල හැක්කේ අවංකව සිදුකරනු ලබන පුද්ගලික හා රාජකාරීමය ගනුදෙනු සඳහා පමණක් වන අතර වානිජමය වශයෙන් අයුතු ප්‍රියෝජන ගැනීම සඳහා කාඩ්පත භාවිතා කිරීමට ඉඩ ලබාදෙනු නොලැබේ. යම් වෙළඳ ස්ථාන මගින් සිදුකරනු ලබන භාණ්ඩ මිලදී ගැනීම් හෝ වෙනත් පහසුකම් සඳහා අදාල වෙළඳ ස්ථානය මගින් අමතර ගාස්තුවක් අය කිරීමේ හැකියාව ඇත.

5.2.2 ආරක්ෂක පියවරක් ලෙස කාඩ්පත නිකුත් කරන අවස්ථාවේ එය වෙළඳ ස්ථානයන්හි භාවිතා කිරීමට ඇති හැකියාව අත්හිටුවා තිබේ. එම ගනුදෙනු සඳහා කාඩ්පත සක්රීපය කර ගැනීමට කාඩ්පත් හිමියා විසින් බැංකු දුරකථන මධ්‍යඇස්ථානය අමතා ඉල්ලීමක් කල යුතුය.

5.2.3 වෙළඳ ස්ථානයන්හි කාඩ්පත භාවිතයෙන් ගෙවීමක් සිදුකිරීමෙන් අනතුරුව ඊට අදාළව ලබාදෙන විකිණුම් සටහන මත කාඩ්පත්හිමියාගේ අත්සන තබා එහි තමාට අයිති පිටපත ලබාගත යුතුය. සාමාන්‍යන තත්වයන්හිදී බැංකුව විසින් කාඩ්පත්හිමියන්හට විකුණුම් සටහනෙහි පිටපත් ලබාදෙනු නොලැබේ. කෙසේ නමුත් බැංකුවෙහි තනි අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන අමතර ගාස්තුවකට යටත්ව පිටපත් ලබාදිය හැක.

5.2.4 බැංකුව මගින් තෝරාගත් අවස්ථාවන්හිදී එකඟ වන පරිදි විද්‍යුකත් අණකර හෝ දුරකථන ඇමතුම් අණකර හෝ අන්තර්ජාල ගනුදෙනු සඳහා පහසුකම් ලබා දෙනු ඇති අතර එම අවස්ථාවන්හිදී කාඩ්පත්හිමියාගේ අත්සන විකුණුම් සටහන මත නොයොදන බව ඔහු/ඇය විසින් පිළිගත යුතුය. එවන් ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන අක්‍ර මිකතා සඳහා කාඩ්පත්හිමියා සහ අදාළ වෙළඳ ස්ථානය වගකිවයුතු අතර ඔවුන් විසින් එම ගනුදෙනුවට අදාල මුදල් බැංකුව වෙත පියවිය යුතුය. මේ කිසිදු කරුණක් සඳහා වගකීම බැංකුව විසින් භාරගනු නොලැබේ.

5.2.5 වෙළඳ ස්ථාන මගින් කාඩ්පත පිළිගැනීම ප්‍රමතික්ෂේප කිරීමට අදාලව කිසිදු වගකීමක් බැංකුව විසින් බාරගනු නොලැබේ.

5.2.6 භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමක් සහ පසුව එය නැවත අවලංගු කිරීම යනු වෙන වෙනම සිදුවන ගනුදෙනු දෙකකි. මුදල් ආපසු කාඩ්පතට බැර කිරීම සිදුවන්නේ (අදාළ අවලංගු කිරීමේ ගාස්තු පවතීනම්, එය අය කර ගැනීමෙන් පසුව) අදාළ වෙළඳ ස්ථානයන්ගෙන් මුදල් ආපසු බැංකුව වෙත ලැබුණු පසුවය. අදාළ මුදල දින 30ක් ඇතුලත බැංකු ගිණුමට බැර නොවුණිනම් කාඩ්පත්හිමියා විසින් වෙළඳ ස්ථානය මගින් ලබාදෙන ණය විස්තර සටහනෙහි පිටපතක්ද සහිතව ඒබව බැංකුවට දැනුම්දිය යුතුය.

5.2.7 වෙළඳ ස්ථානයන්හිදී කාඩ්පත භාවිතයෙන් සිදුවන ගනුදෙනුවල වටිනාකම ගිණුමට හර වේ. තම කාඩ්පත හා සම්බන්ධ කර ඇති ගිණුමට තමාගේ අනෙක් ගිණුම්වලින් මුදල් ඇදීඒමට අවශ්‍යි පහසුකම් (sweep in sweep out facility) පෙර දැනුම්දීමකින් සැකසා ඇති අවස්ථාවකදී හැර වෙළඳ ස්ථානයකදී සිදුවන ගනුදෙනුවක් සඳහා අවශ්‍යp ප්‍රtමාණවත් මුදල් කාඩ්පතට සම්බන්ධ ගිණුමෙහි නොමැතිනම් කාඩ්පත හා සම්බන්ධ අනෙක් ගිණුම්වල සමුච්චිත හෝ වෙන් වෙන් වශයෙන්මුදල් තිබුනද, එවන් අවස්ථාවකදී එම ගනුදෙනුව සිදුකිරීම සඳහා බැංකුව විසින් ඉඩ ලබාදෙනු නොලැබේ.

5.2.8 බැංකුවට තම තනි අභිමතය පරිදි කාඩ්පත භාවිතා කිරීමේ සීමාව සීමා කළහැකි අතර කාඩ්පත්හිමියාට යම් වෙළඳ ස්ථානයකදී තම කාඩ්පත භාවිතයෙන් ගනුදෙනු කල හැක්කේ එම සීමාව දක්වා පමණි.

06. විදේශයකදී කාඩ්පත භාවිතය

කාඩ්පත විදේශ වෙළඳ ස්ථානයන්හි භාවිතා කල හැකි අතර, භාවිතා කිරීමේ සීමාව විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් නිර්දේශකර ඇති සීමාවට වඩා ඉහල නම්, කාඩ්පත්හිමියා විසින් ඒසඳහා අවශ්‍යම අනුමැතිය විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් ලබා ගත යුතු අතර විනිමය පාලන නීති හා රෙගුලාසි වලට එකඟවද කටයුතු කල යුතුය.

07. කාඩ්පතක් ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසි වලට අනුකූලව අදාල සුදුසුකම් සපුරන්නෙකුට කාඩ්පතක් දැරිය සහ/හෝ භාවිත කල හැක. කලානුරූපීව සංශෝධනය වන ශ්‍රීක ලංකා මහා බැංකුවේ රෙගුලාසි වල සඳහන් කටයුතු සඳහා පමණක් කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත්හිමියාට අවසර හිමි වේ. ශ්‍රීු ලංකා මහා බැංකුවේ රෙගුලාසි සහ/හෝ මාර්ගෝපදේශ වලට අදාලව කාඩ්පත්හිමියා යම් අවස්ථාවකදී කාඩ්පත දැරීමට සහ/හෝ භාවිතයට සුදුසුකම් නොලද හොත් ඔහු/ඇය විසින් එම අවස්ථාවේදීම කාඩ්පත අවලංගු කිරීමට හෝ බැංකුව වෙත භාර දීමට කටයුතු කල යුතුය.

08. විදේශ මුදල් ඒකකයන්ගෙන් ගනුදෙනු කිරීම

8.1 ශ්‍රීශ ලංකා රුපියල හැර වෙනත් මුදල් ඒකකයන්ගෙන් සිදුකරනු ලබන ගනුදෙනු ගිණුමට හර වන්නේ බැංකුව විසින් තීරණය කරනු ලබන විනිමය අනුපාතයන්ට අනුව ශ්‍රීප ලංකා රුපියල වෙත නැවත පරිවර්තනය කිරීමෙන් පසුවය.

8.2 බැංකුව විසින් එක් එක් මුදල් ඒකක සඳහා පවත්වාගෙන යන විනිමය අනුපාතයන්ට අනුව සියලුම විදේශ මුදල් ඒකකයන්ගෙන් සිදුවන ගනුදෙනු අදාළ මුදල් හර කිරීමේ ඒකකය වෙත පරිවර්තනය කරනු ලැබේ. එසේ සිදුවන සියලු ගනුදෙනු වලදී පරිවර්තනය වන මුදල් ප්‍රමාණයට අනුව පරිවර්තන සාධකයක්ද එකතු වේ.

09. කාඩ්පතෙහි කාලය ඉකුත්වීම

ඕනෑම කාඩ්පතක් වලංගු වන්නේ එහි මුහුණත මුද්‍රිටත කල් ඉකුත් වීමේ දිනය සහ/හෝ ගිණුම අත්හිටුවන දිනය දක්වා පමණි. කාඩ්පත අලුත් කිරීමේ ක්‍රියාවලිය **5.04** වගන්තියේ දක්වා ඇති පරිදි සිදුවේ.

10. කාඩ්පත බැංකුව සතු දේපළකි

කාඩ්පත සෑම විටකදීම බැංකුව සතු දේපලක් වන අතර බැංකුව ඉල්ලාසිටින ඕනෑම අවස්ථාවකදී කිසිදු කොන්දේසියකින් තොරව කඩිනමින් එය බැංකුව වෙත නැවත ලබා දීමට කාඩ්පත්හිමියා බැදීසිටී.

11. ගාස්තු සහ අයකිරීම්

11.1 කාඩ්පත නිකුත් කිරීමේදී බැංකුවේ ඉල්ලීම මත සම්බන්ධ වීමේ ගාස්තුවක් ගෙවීමට කාඩ්පත්හිමිය එකඟ විය යුතුය.

11.2 කාඩ්පත භාවිතාකිරීම වෙනුවෙන් වාර්ෂික ගාස්තුවක් අය වන අතර කාඩ්පත්හිමයා වෙත බැංකුව විසින් දැනුම් දෙන පරිදි අදාළ මුදල් ප්‍රමාණය ගිණුමට හර වේ.

11.3 කාඩ්පත භාණ්ඩ හුවමාරු සේවාවක් මගින් විදේශ රටකට යැවීමේදී ඊට අදාල පරිහරණ ගාස්තු කඩ්පත්හිමියාගේ ගිනීමට හර වේ.

11.4 කලානුරූපීව පවතින අය ක්‍රෂමයන්ට අනුව කාඩ්පත හා සම්බන්ධ අනෙකුත් ගාස්තුද බැංකුව විසින් කාඩ්පත් හිමියාගේ ගිණුමට හර කරනු ලැබේ.

11.5 බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයට අනුව කාඩ්පත්හිමියාගෙන් පරිහරණ ගාස්තු අයකර ගන්න අතර එම අදාළ ගාස්තු කාඩ්පත්හිමියාගේ ගිණුමට හර කරනු ලැබේ. මෙම ගාස්තුව තැපැල් ගාස්තුවලට අමතරව බැංකුව විසින් අයකර ගන්නා ගාස්තුවකි.

11.6 කාඩ්පත්හිමියාගේ ඉල්ලීම පරිදි බැංකුව විසින් සපයන අමතර සේවාවන් සඳහා අදාළ ගාස්තු අයකර ගැනීමේ අයිතිය බැංකුව සතුවන අතර, එම ගාස්තු කාඩ්පත්හිමියාගේ ගිණුමට හර වේ.

11.7 බැංකුව විසින් පිරිනමන ඕනෑම ගාස්තු අඩුකිරීමක් හෝඉවත්කිරීමක් බැංකුවේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී නැවත ඉවත්කරගැනීමට හෝ සීමා කිරීමට බැංකුවට හැකියාව ඇත.

11.8 පෙට්‍රවල්, ඩීසල්, ගෑස් සහ ශ්‍රීක ලංකාවේ ඉන්ධන පිරවුම්හල් මගින් ලබාදෙන එවැනි සේවාවන් සියල්ල පරිහරණ ගාස්තුවකට යටත් වන අතර, එම ගාස්තුව බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට යටත්ව කාඩ්පත්හිමියාගේ ගිණුමට හර වේ.

11.9 කාඩ්පත භාවිතයෙන් ගුවන් ටිකට්පත් වෙන්කරගන්නා අවස්ථාවකදී, ඒ වෙනුවෙන් අමතර ගාස්තුවක් (අදාළ වේ නම් පමණක්) ගෙවීමට කාඩ්පත්හිමියාට සිදුවනු ඇති අතර එයද කාඩ්පත්හිමියාගේ ගිණුමට හර වනු ඇත. කාඩ්පත්හිමියා විසින් ගුවන් ටිකට්පතක් මිලදී ගැනීමෙන් පසුව නැවත එය අවලංගු කරන අවස්ථාවකදී, අදාළ වෙළඳ ආයතනයේ ප්‍රනතිපත්ති වලට අනුව කාඩ්පත්හිමියා වෙත මුදල් ආපසු ලබා දීමක් සිදුවෙනම්, එම මුදල අදාළ වෙළඳ ස්ථානය විසින් බැංකුව වෙත බැර කිරීමෙන් පසුව සහ කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම ලැබුණු පසුව, අවලංගු කිරීම හා සම්බන්ධ සියලු ගාස්තු අයකර ගැනීමෙන් අනතුරුව ගිණුම වෙත බැර කෙරේ.

11.10 වෙළඳ ස්ථාන මගින් ගනුදෙනු කිරීමේදී ඔවුන් විසින් අයකර ගනු ලබන ඕනෑම අධිකර/කොමිස් මුදල් සහ/හෝ ගාස්තු බැංකුවේ තනි අභිමතය පරිදි කාඩ්පත්හිමියාගේ ගිණුමට හර කල හැක.

12 නිෂ්ප්‍රිභා කිරීම්

12.1 කාඩ්පත අස්ථානගතවීමක් හෝ සොරකම් කිරීමක් පිළිබඳව වගන්ති අංක 18.1 හා 18.2 හි දක්වා ඇති පරිදි, කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත නිසි දැනුම්දීමක් කර ඇති අවස්ථාවකදී හැර, කාඩ්පත යම් වෙළඳ ස්ථානයක භාවිතා කිරීම මගින් ලබාදෙනු ලබන විකුණුම් රිසිට්පත හෝ ගෙවීම් ඉල්ලුම්පතක්, එහි දක්වා ඇති අදාළ මුදල සඳහා කාඩ්පත භාවිතා කර ඇති බවට නිශ්චිත සාධකයක්/සාක්ෂියක් ලෙස සලකනු ලැබේ. කාඩ්පත භාවිතයෙහි වංචනික බවක් ඇත්නම් එය ඔප්පුකර පෙන්වීම කාඩ්පත්හිමියා සතු වගකීමක් වේ.

12.2 විකුණුම් රිසිට්පත යනුවෙන් මෙම වාක්යේ ඛණ්ඩයේ දක්වා ඇත්තේ යම්කිසි/සියලුම අදාළ අවසරලත් කටයුතු සඳහා (උදා:- විවිධ හෝටල් ගාස්තු සහ වෙනත් ගාස්තු) වෙළඳ ස්ථානයකදී කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතය මගින් කරනු

ලබන ගෙවීම්ය. කාඩ්පතෙහි අංකය ඇතුලත් එවැනි විකුණුම් රිසිට්පතක කාඩ්පත්හිමියාගේ අත්සන ඇතුලත් වේනම්, එය එම ගනුදෙනුවෙහි වගකීම කාඩ්පත්හිමියා සතු වන බවට බැංකුව හා කාඩ්පත්හිමියා අතර සාක්ෂියක් වන අතර එම ගනුදෙනුව මගින් කාඩ්පත්හිමියා අදාළ වෙළඳ ස්ථානයෙන් ලබාගත් භාණ්ඩ හා සේවා නිසි අකාරයෙන් ලැබුණු බවට හෝ එම භාණ්ඩ හා සේවා මගින් කාඩ්පත්හිමියා සෑහීමකට පත් වන්නේද යන්න පිළිබඳව බැංකුව විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

12.3 කාඩ්පත භාවිතයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු ගිණුම් ප්රකකාශයක් හා/හෝ කෙටි පණිවිඩ සේවාව (SMS) මගින් කාඩ්පත්හිමියා වෙත දැනුම් දෙනු ලැබේ. කෙටි පණිවිඩ සේවාව මගින් තමාට ලැබුණු ගනුදෙනුවක් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා එකඟ නොවන්නේ නම් එම කෙටි පණිවිඩය ලැබුණු මොහොතේ සිට පැය 48ක් ඇතුලත කාඩ්පත්හිමියා විසින් බැංකුව දැනුවත් කල යුතු අතර ගිණුම් ප්රඩකාශනයක් මාර්ගයෙන් ලැබුණු ගනුදෙනු විස්තරයක් හා කාඩ්පත්හිමියා එකඟ නොවන්නේ නම් එම ගිණුම් ප්රැකාශනය ජනනය කල දිනයේ සිට දින20ක් ඇතුලතදී ඒ පිළිබඳව බැංකුව දැනුවත් කල යුතුය. එසේ දැනුම් දීමක් සිදුනොකරන සෑම අවස්ථාවකදීම ගිණුම් අක්රිමිකතා සහ ගිණුම් ප්රදකාශ ඇතුලු සියලුම සටහන් නිවැරදි බවට බැංකුව විසින් වටහා ගනු ලැබේ. ගිණුම් ප්රඅකාශනයෙහි සඳහන් ගනුදෙනුවක් සම්බන්ධයෙන් තමා එකඟ නොවන බව නිසි පරිදි බැංකුව වෙත දැනුම් දීමෙන් පසුව එමගින් පීඩාවට පත් කාඩ්පත්හිමියා වෙනුවෙන් වාණිජ්‍යමය වශයෙන් සාධාරණයක් ඉටුකිරීම උදෙසා බැංකුව අවංකව කටයුතු කරනු ඇත. බැංකුව විසින් ඒ සඳහා පියවර ගැනීමෙන් පසුව, එම ගනුදෙනුව නිවැරදිව සිදුවූ ගනුදෙනුවක් බවට තහවුරු වුවහොත්, බැංකුව විසින් ඒ පිළිබඳව අදාළ විකුණුම් රිසිට් පතෙහි පිටපතක් හෝ ගෙවීම් ඉල්ලුම් පතෙහි පිටපතක් හෝ සමග, ඒ බව කාඩ්පත්හිමියා වෙත දැනුම්දෙනු ලැබේ.

12.4 යම්කිසි ගනුදෙනුවක් අවලංගු කිරීමේදී හෝ ප්රහතිවර්තනය කිරීමේදී හෝ නිෂ්ප්රපභා කරන ලද ගනුදෙනුවක් ප්රනතිවර්තනය කිරීමෙන් නැවත මුදල් ලබාගැනීමේදී හෝ සිදුවිය හැකි හුවමාරු අලාභයන් සඳහා කාඩ්පත්හිමියා වගකිව යුතුය.

13. කාඩ්පත අගරු කිරීම/ප්ර තික්ෂේප කිරීම

යම්කිසි වෙළඳ ස්ථානයක් මගින් කාඩ්පත පිළිගන්නා බවට කිසිඳු වගකීමක් බැංකුව විසින් ලබා නොදෙන අතර යම් වෙළඳ ස්ථානයක් මගින් කාඩ්පත පිළිගැනීම ප්රඩතික්ෂේප කිරීමේ වගකීමද බැංකුව විසින් දරණු නොලැබේ.

14. නම සහ ලිපිනය වෙනස් කිරීම

කාඩ්පත්හිමියා විසින් තම නම හෝ ලිපිනය වෙනස් කරන්නේ නම් ඔහු/ඇය ඒ බව බැංකුවේ කාඩ්පත් මධ්‍ය ස්ථානය වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

15. භාණ්ඩ හා සේවාවල ගුණාත්මකබව

කාඩ්පත භාවිතා කරමින් වෙළඳ ස්ථානයක් මගින් කරනු ලබන ගනුදෙනු වලදී සිදුවන භාණ්ඩ භාර දීමේ ප්රමමාදයන්, භාණ්ඩ ගෙනවිත් භාර නොදීම, දෝෂ සහිත භාණ්ඩ ලබාදීම ඇතුලු වෙළඳ භාණ්ඩ, වගකීම් සහතික හා සේවාවන් සඳහා බැංකුව වග කියනු නොලැබේ.කාඩ්පත් පහසුකම යනු කාඩ්පත්හිමියන්හට භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා බැංකුව විසින් ලබාදී ඇති පහසුකමක් බවත් එසේ ලබා ගන්නා භාණ්ඩ හා සේවා සඳහා කිසිඳු ආකාරයක වගකීමක් හෝ එම භාණ්ඩ හා සේවාවන්හි තත්වය, ප්රබමාණය හෝ භාරදීම පිලිබඳ නියෝජනයක් බැංකුව විසින් සිදු නොකරන බවත් කාඩ්පත්හිමියා විසින් අවබෝධ කරගත යුතුය.එවන් භාණ්ඩ හා සේවා සම්බන්ධ යම් ප්රෝතික්ෂේප කිරීමක් ඇත්නම් එය අදාළ වාණිජ ස්ථානය සමග සම්මත කරගත යුතුය. කාඩ්පත්හිමියකු විසින් ඕනෑම නිෂ්ප්රකභා කිරීමක් සම්බන්ධව බැංකුව වෙත දන්වමින් වන්දි මුදලක් ඉල්ලුම් කල තිබුනද, අදාළ නිෂ්ප්රාභා කිරීම සම්බන්ධව කාඩ්පත්හිමියා සතුවන බැඳීම ඉවත් නොවේ.

16. වගකීම් නිශේධනය

16.1 පහත සිදුවීම් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රාකකාරයෙන් ඇතිවන පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් බැංකුව කිසිදු අයුරකින් කාඩ්පත්හිමියාට වගකියනු නොලැබේ.

අ) යම් වෙළඳ ස්ථානයකින් ලබා ගන්න ඕනෑම භාණ්ඩයක/සේවාවක ඇති දෝෂයක්

ආ) යම් පුද්ගලයකු හෝ වෙළඳ ස්ථානයක් මගින් කාඩ්පත භාර ගැනීම ප්‍රිතික්ෂේප කිරීමක්

ඇ) ඕනෑම පරිඝනක ජාලයක, ස්වයංක්‍රීකය ටෙලර් යන්ත්‍රයක සහ/හෝ (POS) ටර්මිනලයක් සහිත ස්ථානයක ඇති යන්ත්‍රව වල සිදුවන අක්‍රඩමිකතා

ඇ) කාඩ්පත්හිමියා හැර වෙනත් පුද්ගලයෙකු විසින් ගනුදෙනුවලට අදාලව බැංකුව වෙත ලබාදෙන උපදෙස්

ඉ) ඕනෑම පුද්ගලයෙකු විසින් කාඩ්පත නැවත භාර දෙන ලෙස කරනු ලබන ඕනෑම ප්‍රදකාශයක් හෝ එවැනි ප්‍රPකාශයක් හා සම්බන්ධයෙන් සිදුකරන ඕනෑම ක්‍රිියාවක්.

ඊ) බැංකුව විසින් පත් කරන ලද නිලධාරියෙකු හැර වෙනත් පුද්ගලයෙකුට කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පත භාරදීම.

උ) බැංකුව විසින් තමන් සතු අයිතීන් ක්‍රිුයාත්මක කරමින්, බැංකුව විසින් හෝ බැංකුවේ නියෝජිතයෙකු විසින් කාඩ්පතෙහි මුහුණතෙහි සඳහන් කල් ඉකුත් වීමේ දිනයට පෙර කාඩ්පත බැංකුව වෙත අත්පත් කරගැනීම

ඌ) බැංකුව විසින් තමන් සතු අයිතීන් ක්‍රි යාත්මක කරමින් කාඩ්පත අවලංගු කිරීම හෝ අවහිර කිරීම

එ) බැංකුව විසින් තමන් සතු අයිතීන් ක්‍රි යාත්මක කරමින් කාඩ්පත භාවිතය සඳහා ලබාදී ඇති සීමාවන් වෙනස් කිරීම

ඒ) බැංකුව විසින් නැවත කාඩ්පත භාරදෙන ලෙසට කරනු ලබන ඉල්ලීමක් හෝ යම් වෙළඳ ස්ථානයක් මගින් කාඩ්පත ප්‍රැතික්ශේප කිරීම තුලින් කාඩ්පත්හිමියාගේ කීර්තිනාමයට සිදුවන හානිය

ඔ) 19 වන කොටස හා සම්බන්ධව ඕනෑම විස්තරයක සිදුවියහැකි ඕනෑම අවප්‍රවකාශයක්, අවනිර්දේශයක්, දෝෂයක් හෝ ප්‍රැමදදෝශයක්

ඕ) ඕනෑම හේතුවක් මත සිදුවන ගාස්තු වල අඩුවීමක්

16.2 සන්නිවේදන සහ විවිධ සේවා සැලසීම ආදිය තුන්වන පාර්ශවීය සේවා සපයන්නන් හා/හෝ තුන්වන පාර්ශවීය සේවා සපයන්නන්ගේ කොන්ත්‍රාතත්කරුවන් මාර්ගයෙන් සිදුවන අතර ඔවුන් සඳහා එම තුන්වන පාර්ශවීය සේවා සපයන්නන් හෝ බැංකුව මගින් සියලු ගෙවීම් සිදුකරයි. කාඩ්පත්හිමියන් විසින් භාවිතාකරනු ලබන එවැනි සේවාවන් සඳහා වන පිරිවැයෙහි වගකීම කාඩ්පත්හිමියා සතු වේ. අදාළ සේවාවන් සඳහා අවශ්‍යන සහය හැකි උපරිමයෙන් ලබා දීමට බැංකුව කටයුතු කරන අතර කාලය, දුර සහ ප්‍රසදේශය අනුව එම සේවා සඳහා සහය ලබා දීමට නොහැකි වනුඇත. තුන්වන පාර්ශවීය සේවා සපයන්නන් විසින් යෝජනා කරනුලබන හා/හෝ නම් කරනු ලබන රක්ෂණ, වෛද්‍යන හා/හෝ නීතිමය වෘර්තියවේදීන් එම තුන්වන පාර්ශවීය සේවා සපයන්නන් හෝ ඔවුන් හා අනුබද්ධ කොන්ත්‍රා ත්කරුවන් යටතේ සිටින සේවකයින් නොවන අතර, එබැවින් එම සේවාවන් පැවතීම, භාවිතයට ගැනීම, ක්‍රිනයාවට නැංවීම, ප්‍රනමාදදෝෂයන් හෝ ඒවායේ ප්‍රනතිපලයන් සඳහා ඔවුන් වගකියනු

නොලැබේ. ඉහත සඳහන් පාර්ශවයන්ගෙන් සිදුවන කුමන අකාරයේ හෝ සේවා සැකසීමකට හෝ සපයන ලද සේවාවන් භාවිතයට හෝ සිදුවන ප්‍රහමදදෝශයන්ට බැංකුව විසින් වගකියනු නොලැබේ.

17. තොරතුරු අනාවරණය කිරීම

මෙම 17වන බන්ධයෙහි ඉදිරියට සඳහන් කර ඇති ආකාරයට නීතිමය වශයෙන් ලබා දී ඇති සීමාව දක්වා කාඩ්පත්හිමියා හා බැංකුව අතර ඇති සියලුම ගනුදෙනු විස්තර රහස්‍යකභාවයෙන් යුතුව ආරක්ෂා කිරීමට බැංකුව බැදීසිටී. එසේ වුවත්, කාඩ්පත්හිමියා විසින් කාඩ්පත්හිමියා හා/හෝ ගිණුම් සම්බන්ධ තොරතුරු පහත සඳහන් අය වෙත ලබා දීමට මෙයින් බැංකුව වෙත බලය පවරනු ලැබේ.

17.1 ඕනෑම බැංකුවක් හෝ මුල්‍යක ආයතනයක්, හෝ ණය තොරතුරු කාර්යාංශය, හෝ ගෙවීම් පැහැරහරින ගනුදෙනුකරුවන් පිලිබඳ ණය තොරතුරු හා දත්ත පාලනය කරනුලබන පොදු සේවා සපයන්නන්ට;

17.2 බැංකුව වෙනුවෙන් පත්කර ඇති නිත්‍යන හෝ යෝජනා කරන ලද ඕනෑම බලධාරියෙකු හෝ මෙම ගිවිසුමට හෝ ගිණුමට සම්බන්ධ බැංකුව සතු අයිතීන් පවරනු ලැබූ පැවරුම්ලාභියෙකු හෝ හවුල්කරුවකු හෝ උප හවුල්කරුවකු;

17.3 රහස්යිභාවය පිලිබඳ සේවයේ නියුතු බැංකුවෙහි හෝ ඒ හා සම්බන්ධ වෙනත් ආයතනයක ඕනෑම නියෝජිතයෙකු හෝ කොන්ත්‍රා.ත්කරුවකු හෝ සේවා සපයන්නෙකු;

17.4 ඕනෑම පාලන හෝ නියාමන අධිකාරියකට;

17.5 ශ්‍රී ලංකාවේ පවත්නා නීතියට අදාළ කටයුතු සඳහා අවසර ලත් ඕනෑම පුද්ගලයෙකුට

17.6 වාණිජ කටයුතු සඳහා බැංකුව හා සම්බන්ධ වී සිටින ඕනෑම ආයතනයක්, කාර්යාලයක් හෝ ශාඛාවක්

17.7 MasterCard ජාත්‍යකන්තර සමාගම හෝ ඊට අනුබද්ධිත ඕනෑම සමාගමක් හෝ MasterCard ජාත්‍ය න්තර සමාගමෙහි අභිමතය පරිදි පත්කරන ඕනෑම සමාගමක් හෝ පාර්ශවයක්

17.8 Cargills Ceylon, CT Holdings හා/හෝ කාගිල්ස් සමූහය හා සම්බන්ධ ඕනෑම සමාගමක්

18. අස්ථානගත වූ කාඩ්පත් සඳහා වගකීම

18.1 කාඩ්පතක් අස්ථානගතවුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් වහාම ඒ පිලිබදව කාඩ්පත්හිමියා විසින් ශ්‍රීස ලංකාව තුල ක්‍රි.යාත්මක වන කාගිල්ස් බැංකු දුරකථන මධ්යරස්ථානය වෙත දැනුම්දිය යුතුය. එසේම කාඩ්පත්හිමියා විසින් එම අස්ථානගතවීම හෝ සොරකම් කිරීම හෝ සිදුවූ ප්‍රදේශයේ පොලිසිය හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනය වෙත පැමිණිලි කල යුතුය. බැංකු දුරකථන මධ්‍ය ස්ථානය වෙත අදාළ අස්ථානගතවීම හෝ සොරකම්කිරීම පිලිබඳ දැනුම් දෙනතුරු කාඩ්පත භාවිතා කරමින් කෙරෙන ගනුදෙනු සඳහා සියලු වගකීම කාඩ්පත්හිමියා සතු වේ.

කාඩ්පත අස්ථානගතවීම පිලිබඳ දුරකථනය ඔස්සේ දැනුම්දීමට කාඩ්පත්හිමියාට හැකි අතර ඉන් අනතුරුව කාඩ්පත අස්ථානගතවීම තහවුරු කරමින් සහ කාඩ්පතින් සිදුකරන අයකිරීම් ප්‍රතික්ෂේප කරමින් (තිබේනම් පමණක්) කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක පිටපතක් බැංකු දුරකථන මධ්‍යස්ථානය වෙත ලබා දිය යුතුය. එමෙන්ම අත්සන් කරන ලද, පොලිසිය හෝ නීතිය ක්‍රියාත්මක කරන ආයතනය වෙත කරන ලද පැමිණිල්ලෙහි පිටපතක්ද බැංකුව වෙත භාර දිය යුතුය. ප්‍රනමාණවත් තහවුරු කරගැනීමකින් පසුව බැංකුව විසින් අදාළ කාඩ්පත තාවකාලිකව අත්හිටවනු හෝ අවහිරකරනු ලබන අතර ගිණුම සම්බන්ධයෙන් කාඩ්පත්හිමියාට ඇතිවන අපහසුතාවයන්ට බැංකුව වගකියනු නොලැබේ. කාඩ්පත්හිමියා විසින් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන කාගිල්ස් බැංකු දුරකථන මධ්‍යවස්ථානය වෙත දැනුම්දීම සිදුකිරීමට පෙර අවසර නොලත් කාඩ්පත් භාවිතය තුලින් ගිණුමට හරවූ සියලු මුදල් හා විසදීමට ඇති ගනුදෙනු සියල්ල සඳහා වගකීම කාඩ්පත්හිමියා සතු වේ. කාඩ්පතක් අස්ථානගතවීම, සොරකම් කිරීම හෝ පලුදු වීම සම්බන්ධයෙන් දැනුම් දීමක් කල පසුව නැවත එය ඒ මොහොතේම හමුවුවද එම අවස්ථාවේ කාඩ්පත පාවිච්චි කිරීම තුලින් අදාළ ගනුදෙනුව අගරු වීමට හැකියාව ඇත. කාඩ්පතක් අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද හෝ පලුදු වූ බව කාඩ්පත්හිමියා විසින් දැනුම් දීමෙන් පසුව එම මොහොතේම නැවත කාඩ්පත හමුවුවද බැංකුව විසින් එය අවලංගු කර තිබීමේ සම්පූර්ණ වගකීම කාඩ්පතිහිමියා සතු වේ. කාඩ්පතෙහි ආරක්ෂාව පිලිබඳ වගකීම සැමවිටම කාඩ්පතෙහි හිමිකරුට පැවරෙන අතර එය ආරක්ෂා කර ගැනීමට අවශ්‍යස පියවර ඔහු/ඇය විසින් ගත යුතුය.

18.2 කාඩ්පත අස්ථානගතවූ, සොරකම් කල හෝ අවභාවිතයක් සිදුවූ සෑම අවස්ථාවකදීම බැංකුව විසින් එය නැවත ලබා ගැනීම හා සම්බන්ධ අවශ්‍යප සියලු පියවර ගැනීම සඳහා කාඩ්පත්හිමියා විසින් තමා සතු ඊට අදාළ සියලු විස්තර බැංකුව වෙත ලබා දියයුතුය.

18.3 කාඩ්පත අස්ථානගත වූ අවස්ථාවකදී ඒ පිලිබඳ MasterCard ජාලය දැනුවත් කිරීම සඳහා වන පරිපාලන වියදම් කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුය.

18.4 කාඩ්පතක් අස්ථානගතවූ හෝ සොරකම්කලවිටකදී ආදේශක කාඩ්පතක් නිකුත්කිරීමට බැංකුව බැඳී නොසිටී. ලබා දෙන ඕනෑම අදේශක කාඩ්පතක් බැංකුව මගින් තීරණය කරනු ලබන ගාස්තුවකට යටත්ව ලබා දෙන අතර එම ගාස්තුව අදාළ ගිණුමට හර වේ. එමෙන්ම එම ආදේශක කාඩ්පතද මුල් කාඩ්පතට අදාළ නියමයන්ට හා කොන්දේසිවලට යටත් වේ.

18.5 පුද්ගලික රහස්‍යක අංකය (PIN) සහ/හෝ OTAC සහ/හෝ දුරකථන රහස්‍යා අංකය (T-PIN) අස්ථානගත වීමක්, සොරකම්කිරීමක් හෝ වෙනත් පාර්ශවයකට අනාවරණය වීමක් සිදුවුවහොත් වහාම කාඩ්පත්හිමියා විසින් ඉහත 18.1 හා 18.2 කොටස් වල දක්වා ඇති පරිදි බැංකුව දැනුවත් කල යුතුය.

19. උල්ලංඝනය කිරීම්

කාඩ්පත්හිමියා විසින් මෙම ගිවිසුම යම් අවස්ථාවක උල්ලංඝනය කළහොත්,

එම උල්ලංඝනය කිරීම නිසා බැංකුව වෙත ඍජුව හෝ වක්‍රා කාරයෙන් සිදුවන ඕනෑම අලාභයක් වෙනුවෙන් වන්දි ගෙවීමට කාඩ්පත්හිමියාට සිදුවනු ඇත.

20. කාඩ්පත අවලංගු කිරීම

20.1 ඕනෑම අවස්ථාවකදී ලිඛිත දැනුම්දීමක් සමගින් කාඩ්පත නැවත බැංකුව වෙත ලබා දෙමින් එය අවලංගු කිරීමේ හැකියාව කාඩ්පත්හිමියාට පවතී.

20.2 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත අවලංගු කිරීමට ලබා දෙන ලිඛිත දැනුම්දීම ක්රි යාත්මක වන්නේ කාඩ්පත, එහි චුම්භක තීරුව කැපීයන අයුරින් කොටස් 4කට කපා බැංකුව වෙත ලබා දීමෙන් පසුවය.

20.3 ඉහත සඳහන් කල පරිදි මිස, කාඩ්පත්හිමියාට පමණක් තම කාඩ්පත අවලංගු කල නොහැක.

20.4 කාඩ්පත්හිමියා විසින් කාඩ්පත විනාශ කල බවට දැනුම් දී තිබුනද එසේ නොකර නැවත එම කාඩ්පත භාවිතා කළහොත්, එය අවභාවිතයක් නිසා සිදුවුවද, බැංකුවට පෙර දැනුම්දීමක් කර තිබුනද, එම ගනුදෙනුව හා සම්බන්ධ අයකිරීම් සඳහා වගකීම කාඩ්පත්හිමිනියා සතු වේ.

20.5 හේතුවක් හෝ පෙර දැනුම්දීමක් සහිතව හෝ රහිතව ඕනෑම අවස්ථාවකදී බැංකුවේ පූර්ණ අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමට හෝ කාඩ්පත නැවත කැඳවීමට හෝ ඒ හා සම්බන්ධ වෙනත් ඕනෑම සේවාවක් නවතා දැමීමට බැංකුවට හැකියාව ඇත. කාඩ්පත අවසන් කිරීම හා සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා හා බැංකුව අතර ගිවිසුමෙහි සඳහන්ව තිබුනද මෙම අවස්ථාවේදී කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත්හිමියාට ඇති අයිතිය වහාම ඇනහිටිනු ඇත.

20.6 කාඩ්පත්හිමියා විසින් තම බැංකු ගිණුම අත්හිටුවීමට තීරණය කරන අවස්ථාවේදී එම ගිණුම සඳහා නිකුත් කරන ලද කාඩ්පත ස්වයංක්රී යව අවලංගු වේ. කාඩ්පත්හිමියා විසින් එම අවස්ථාවේදීම කාඩ්පත භාවිතය නවතා, එම කාඩ්පත විනාශ කර එය බැංකුව වෙත නැවත බාර දිය යුතුය.කාඩ්පත මගින් සිදුකරන ලද ගනුදෙනුවක් එම අවස්ථාව වනවිට ගිණුමට හරවී නොමැතිනම් එම අදාළ ගනුදෙනුව හා සම්බන්ධ මුදල් ප්රමමාණය ගිණුමට හර කිරීමෙන් පසුව ගිණුමේ ඇති ශේෂය ගිණුම්හිමියා වෙත ලබා දෙනු ඇත.

20.7 කාඩ්පත කඩිනමින් අවලංගු කිරීමට බැංකුවට හැකියාව ඇති අතර පහත සඳහන් අවස්ථාවන්හිදී කාඩ්පත නැවත භාර දීමට කාඩ්පත්හිමියාට සිදුවනු ඇත.

අ) ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකුල නොවූ අවස්ථාවකදී

ආ) බැංකුව හා සම්බන්ධ ඕනෑම ගිවිසුමක් හෝ වගකීමක් පැහැරහරිනලද අවස්ථාවක (අසම්භාවියන හෝ එසේ නොවන)

ඇ) කාඩ්පත්හිමියා යම්කිසි බංකොලොත්භාවයකට පත් වුවහොත්, එවැනි ක්රිඅයාවක් හෝ ඒ හා සමාන තත්වයක් ඇතිවුවහොත්

ඈ) කාඩ්පත්හිමියාගේ අභාවයකදී

ඉ) ගිණුමක් අත්හිටුවන අවස්ථාවේදී හෝ ගිණුමෙහි පවත්වාගත යුතු අවම මුදල් ප්ර මාණය පවත්වාගැනීමට නොහැකි වූ අවස්ථාවකදී

21. සංශෝධන

කලානුරූපීව ගිවිසුමෙහි ඇති කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වේ (කොන්දේසි අලුතින් ඇතුලත් කිරීමට, වෙනස් කිරීමට, ආදේශ කිරීමට හෝ ඉවත් කිරීමට). මෙලෙස සිදුවන සංශෝධනයන් කාඩ්පත්හිමියාට පැවසීම මගින් හෝ ගිණුම් ප්රමකාශනය සමග අමුණා එවීම මගින් හෝ ශ්රීත ලංකාව තුල ප්රනකාශිත එක් හෝ එකකට වැඩි පුවත්පත් සංඛ්යාකවක පල කිරීම තුලින් හෝ බැංකුවෙහි, බැංකු ශාඛාවෙහි හෝ නිල වෙබ් අඩවියෙහි දැන්වීමක් ලෙස පලකිරීමෙන් හෝ දැනුම්දෙනු ලැබේ. අදාළ සංශෝධන බලසහිත වන දිනයෙන් පසුව කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතා කරන්නේ නම් ඔහු/ඇය විසින්

එම සංශෝධන පිළිගත් බවට සලකනු ලැබේ. සංශෝධනයෙහි ඇතුලත් කරුණු සමග කාඩ්පත්හිමියා එකග නොවන්නේනම්, සංශෝධන බලසහිත වන දිනයට පෙර තම කාඩ්පත බැංකුව වෙත ලබා දී අවලංගු කලයුතුය.

22. නිවේදන

බැංකුව විසින් ඕනෑම නිවේදනයක් පෙර ගෙවුම් තැපැල මගින් සාමාන්‍යග ලිපිනයට හෝ අවසන් වරට දැනුම්දී තිබෙන ලිපිනය වෙත ලැබීමට සලස්වනු ඇති අතර එසේ යැවූ පසු අදාළ නිවේදනය කාඩ්පත්හිමියා වෙත ලැබුණු බවට සලකනු ලැබේ.

කාඩ්පත් හිමියා විසින් ඕනෑම නිවේදනයක් පෙරගෙවුම් තැපැල මගින් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

සීමාසහිත කාගිල්ස් බැංකුව
ප්‍රධාන කාර්යාලය
අංක 696, ගාලු පාර
කොළඹ 03

කාඩ්පත්හිමියාට පහත සඳහන් අංකයට ඇමතීම මගින් ශ්‍රීත ලංකාව තුල ක්‍රියාත්මක බැංකු දුරකථන මධ්‍ය ස්ථානය හා සම්බන්ධ විය හැක.
+94 (011) 7 640 640

23. බලාත්මක කිරීමේ වියදම්

මෙහි සඳහන් කොන්දේසි සහ නියමයන් බලාත්මක කිරීමේදී බැංකුව විසින් දරනු ලබන නීතිමය වියදම් ඇතුලු සියලුම වියදම් සඳහා කාඩ්පත්හිමියා වගකිවයුතු අතර එම වියදම් පූර්ණ වශයෙන් ඔහු/ඇය විසින් ගෙවීමට බැදී සිටී.

24. සාමාන්‍යු තොරතුරු

24.1 කාඩ්පතක් පිළිගැනීම මගින් කාඩ්පත්හිමියා බැංකුව තුල දැනට පවතින සියලුම සේවාවන්, පහසුකම් හා කාඩ්පත හරහා කරනු ලබන ගනුදෙනු හා සම්බන්ධ සාමන්යි ව්‍යාපාරික කොන්දේසි වලට බැදී සිටී.

24.2 කාඩ්පත්හිමියන්ගේ බැංකුව සමග ඇති පක්ෂපාතිත්වය හා සම්බන්ධ වැඩසටහන් වලදී එක් එක් වැඩසටහනට වෙන් වෙන්ව අදාළ වන කොන්දේසි හා නියමයන්ට අනුව ඒවා ක්‍රියාත්මක වේ.

24.3 යම් වෙළඳ ස්ථානයක් මගින් ඔවුන්ගේ භාණ්ඩ හා සේවාවන් සඳහා වට්ටමක් හෝ මිල අඩු කිරීමක් ලබා දෙන අවස්ථාවකදී කාඩ්පත් පිළිගැනීම ප්‍ර තික්ෂේප කිරීමට ඉඩ ඇත.

24.4 මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවකදී වෙනස්කිරීමට බැංකුවට අයිතිය ඇති අතර, එවන් වෙනස් කිරීමක් සිදු වුවහොත් ඒ පිළිබඳව කාඩ්පත්හිමියා දැනුවත් කරනු ඇත. එම අදාළ දැනුම්දීමෙන් පසුව කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පත භාවිතා කල හොත්, දැනුම්දීමෙහි සඳහන් කරුණු සමග කාඩ්පත්හිමියා එකඟ වූවාසේ සැලකේ. කාඩ්පත්හිමියා අදාළ වෙනස්කම් සමග එකඟ නොවන්නේනම් කාඩ්පතෙහි ඇති චුම්භක තීරුව කැපියන ආකාරයට කාඩ්පත කපා, එම කොටස් නැවත බැංකුව වෙත භාරදිය යුතුය. එවන් අවලංගු කිරීමකට පෙර සිදුවන සෑම ගාස්තු අය කර ගැනීමකම වගකීම කාඩ්පත්හිමියා සතු වේ.

24.5 යම්කිසි බැංකු ගිණුමක/ ගිණුම් කිහිපයක හෝ කාඩ්පත් භාවිතය හා සම්බන්ධව අදාළ නියමයන් කඩවන බවට බැංකුව විසින් දැනගත හොත් හෝ එවැන්නක් පිළිබඳව සැකයක් මතුවුවහොත්, බැංකුව විසින් තම තනි අභිමතය පරිදි එම ගනුදෙනුව සඳහා අවසර ලබා දීම ප්රථික්ෂේප කරන අතර ඒ පිළිබඳව හැකි ඉක්මනින් කාඩ්පත්හිමියා දැනුවත් කරනු ඇත.

24.6 කාඩ්පත ලබා දීම/ භාවිතය/ අස්ථානගතවීම සහ/හෝ පුද්ගලික රහස් අංකය (PIN) සහ/හෝ OTAC සහ/හෝ දුරකථන රහස් අංකය (T-PIN) යන කරුණු හා සම්බන්ධයෙන් ඇතිවන අලාභ හෝ පාඩු සඳහා බැංකුව වගකියනු නොලැබේ.

25. නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්රී ලංකාවේ පවතින නීති වලට අනුව අර්ථවිග්රබහ කර බලපවත්වනු ලැබේ. නීතිය, රජයේ රෙගුලාසි හෝ ශ්රී ලංකා මහා බැංකුව හෝ වෙනත් ව්යිවස්ථාපිත සංවිධානයක් මගින් නිකුත් කරනු ලබන උපදෙස් වල යම් වෙනසක් සිදුවුවහොත් ඒ අනුව මෙම ගිවිසුමද ස්වයංක්රීලයව වෙනස් වනු ඇත. කාඩ්පත භාවිත කල හැක්කේ අවසරලත් නීත්යනනුකුල කටයුතු සඳහා පමණි. එසේ නොවන වෙනත් කටයුතු සඳහා කාඩ්පත්හිමියා හෝ කඩ්පත්හිමියා විසින් වෙනත් අයෙකු ලවා කාඩ්පත භාවිත කළහොත් එමගින් සිදුවන සියලු අලාභයන් හා වියදම් බැංකුව වෙත හෝ MasterCard ජාත්ය න්තර සමාගම වෙත ආපසු ගෙවීමට කාඩ්පත්හිමියා හට සිදුවනු ඇත.

26. පැවරීම හා සම්බන්ධ කොන්දේසි

වර්තමානයටත් අන්නගතයටත් බලපැවෙත්වෙන පරිදි මෙම ගිවිසුම, සම්පූර්ණ වශයෙන් හෝ එක් කොටසක්, බැංකුව විසින් MasterCard ජ්යාතත්යනන්තර සමගම හෝ ඒ හා අනුබද්ධ ඕනෑම සමාගමකට පැවරීම සහ, එවැනි පැවරීමක් බැංකුව විසින් හෝ MasterCard ජ්යාතත්යනන්තර සමගම හෝ ඒහා අනුබද්ධ ඕනෑම සමාගමක් විසින් කාඩ්පත්හිමියා හට ලබාදෙන පැවරීම හා සම්බන්ධ නිවේදනයෙහි මෙකී පැවරීම බලපැවෙත්වෙන දිනය ලෙස සඳහන් වී ඇති දින සිට එය බල පැවෙත්වෙන බවට එකඟ වන බව මින් ප්ර තිඥ දෙනු ලැබේ.